# වාර්ෂික වාර්තාව

# 2019

NMRA

NATIONAL MEDICINES REGULATORY AUTHORITY

**ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA)**

**අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10.**

# පටුන


පිටු අංක.

| | | |
|---|---|---|
| සභාපතිතුමාගේ පණිවිඩය ........................................................................................ | | 04 |
| ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ පණිවිඩය ................................................................... | | 05 |
| අධ්‍යක්ෂ මණ්ඩලය ................................................................................................ | | 06 |
| 1 වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / විධායක සංක්ෂිප්තය ...................................... | | 07 |
| 1.1 | හැඳින්වීම .......................................................................................... | 07 |
| **1.2** | සංවිධානයේ දැක්ම, මෙහෙවර, අරමුණු ........................................................ | 08 |
| | 1.2.1 සංවිධානයේ දැක්ම ........................................................................ | 08 |
| | 1.2.2 සංවිධානයේ මෙහෙවර .................................................................... | 08 |
| | 1.2.3 අධිකාරියේ අරමුණු ........................................................................ | 09 |
| 1.3 | ප්‍රධාන කාර්යයන් .................................................................................. | 10 |
| 1.4 | පිරිස් ප්‍රතිපාදනය .................................................................................. | 10 |
| 1.5 | ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ පවතින අංශ ......................................... | 11 |
| | 1.5.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) .............. | 12 |
| | 1.5.1.1 හැඳින්වීම ........................................................................ | 12 |
| | 1.5.1.2 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි ආංශික ව්‍යුහය | 13 |
| | 1.5.1.3 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි ප්‍රධාන කාර්යයන් | 13 |
| | 1.5.2 ඖෂධ නිෂ්පාදන නියාමන අංශය ........................................................ | 14 |
| | 1.5.2.1 හැඳින්වීම ........................................................................ | 14 |
| | 1.5.2.2 ඖෂධ නිෂ්පාදන නියාමන අංශයේ ආංශික ව්‍යුහය ..................... | 14 |
| | 1.5.2.3 ඖෂධ නිෂ්පාදන නියාමන අංශයේ කාර්යයන් ........................... | 14 |
| | 1.5.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය ............................................... | 15 |
| | 1.5.3.1 හැඳින්වීම . ....................................................................... | 15 |
| | 1.5.3.2 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ ආංශික ව්‍යුහය........... | 15 |
| | 1.5.3.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ කාර්යයන් ................. | 16 |

පිටු අංක.

1.5.4 මූල්‍ය අංශය .......................................................................................... 16

1.5.4.1 හැඳින්වීම ........................................................................................ 16

1.5.4.2 මූල්‍ය අංශයේ ආංශික ව්‍යුහය ....................................................... 16

1.5.4.3 මූල්‍ය අංශයේ කාර්යයන් ........................................................... 17

1.5.5 පරිපාලන අංශය ........................................................................................ 17

1.5.5.1 හැඳින්වීම ........................................................................................ 17

1.5.5.2 පරිපාලන අංශයේ ආංශික ව්‍යුහය ............................................. 17

1.5.5.3 පරිපාලන අංශයේ කාර්යයන් ..................................................... 18

1.5.6 නීති අංශය .................................................................................................. 18

1.5.6.1 හැඳින්වීම ........................................................................................ 18

1.5.6.2 නීති අංශයේ ආංශික ව්‍යුහය ...................................................... 19

1.5.6.3 නීති අංශයේ ප්‍රධාන කාර්යයන් ................................................ 19

1.5.7 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අංශය .................................. 19

1.5.7.1 හැඳින්වීම ........................................................................................ 19

1.5.7.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ ආංශික ව්‍යුහය ..... 20

2 වන පරිච්ඡේදය - ප්‍රගතිය සහ දැක්ම ......................................................................... 21

2.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ (NMQAL) ප්‍රගතිය ............ 21

2.2 ඖෂධ නිෂ්පාදන නියාමන අංශයේ ප්‍රගතිය ....................................................... 23

2.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ (IED) ප්‍රගතිය .................................. 24

2.4 මූල්‍ය අංශයේ ප්‍රගතිය ........................................................................................ 31

2.5 පරිපාලන අංශයේ ප්‍රගතිය ................................................................................ 31

2.6 නීති අංශයේ ප්‍රගතිය ........................................................................................ 32

3 වන පරිච්ඡේදය - සමස්ත මූල්‍ය කාර්ය සාධනය ............................................................ 36

4 වන පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය (SDG) 66

5 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ ................................................................ 67

5.1 පිරිස් කළමනාකරණය ........................................................................................ 67

# කෙටි යෙදුම් ලැයිස්තුව

| | |
|---|---|
| BPEC | සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් කමිටුව |
| CDD Act | විලවුන් උපකරණ සහ ඖෂධ පනත |
| CFDI | ප්‍රධාන ආහාර හා ඖෂධ පරීක්ෂක |
| DO | සංවර්ධන නිලධාරී |
| FDI | ආහාර සහ ඖෂධ පරීක්ෂක |
| GDP | යහපත් බෙදාහැරීමේ පරිචයන් |
| GLP | යහපත් රසායනාගාර පරිචයන් |
| GMP | යහපත් නිෂ්පාදන පරිචයන් |
| GPP | යහපත් ඔසුසල් පරිචයන් |
| ICT | තොරතුරු සන්නිවේදන තාක්ෂණය |
| ID Card | හැඳුනුම්පත |
| IED | අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය |
| ISO | ප්‍රමිතිකරණය සඳහා ජාත්‍යන්තර සංවිධානය |
| IT | තොරතුරු තාක්ෂණය |
| KKS | කාර්යාල කාර්ය සහයක |
| MA | කළමනාකරණ සහකාර |
| MDEC | වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව |
| MEC | ඖෂධ ඇගයීම් කමිටුව |
| NDDCB | ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලය |
| NDQAL | ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය |
| NMQAL | ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය |
| NMRA | ජාතික ඖෂධ නියාමන අධිකාරිය |
| SCOCT | සායනික පර්යේෂණ අනු කමිටුව |
| SDG | තිරසාර සංවර්ධන අරමුණු |
| SSFFC | බාලකළ/ කූට/ ව්‍යාජ ලෙස ලේබල් කල/ ව්‍යාජ/ නොමඟ යවන සුළු |
| TRIPS | බුද්ධිමය දේපල හිමිකම් පිළිබඳ වෙළඳාමට අදාළ අංශ |
| UNDP | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන |
| WD | ආපසු ගැනීම |
| WH | රඳවා ගැනීම |
| WHO | ලෝක සෞඛ්‍ය සංවිධානය |

# සභාපතිතුමාගේ පණිවිඩය

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කරන ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2019 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම පිළිබඳව මම සතුටට පත්වෙමි. ජාතික ඖෂධ ප්‍රතිපත්තියට අනුකූල වන ආකාරයට ජනතාව විසින් පරිභරණය කරනු ලබන සියළුම ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන හා විලවුන් වර්ග ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී, ගුණාත්මක, ක්‍රියාකාරි හා දැරිය හැකි මිලකට අවශ්‍ය පරිදි ළගාකර ගැනීමට හැකි බව පරීක්ෂා කිරීම මෙම ආයතනයේ ප්‍රධාන කාර්යභාරය වේ.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටිතල පහසුකම් සපුරා ගැනීමේ හා විශේෂයෙන්ම මානව සම්පත් ප්‍රමාණවත් පරිදි නොවීම වැනි අභියෝග රැසකට මුහුණ දෙමින් රට තුල භාවිතා වන ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන හා විලවුන් වලට අදාලව සියලුම කරුණු නියාමනය කිරීමේ කටයුතු කාර්යක්ෂමවත්, සඵලදායි ලෙසත් සහ ඉහළ විනිවිදභාවයකින් සිදු කරමින් ආයතනයේ අරමුණු මුදුන් පමුණුවා ගැනීමට වෙර දරනු ලබයි. තවද ඖෂධ නිෂ්පාදන නියමිත ප්‍රමිතීන්ට අනුකූලදැයි සොයා බැලීමට තාක්ෂණ සහය ලබා දෙන ජාතික මට්ටමෙන් පිළිගනු ලබන ප්‍රධාන පරීක්ෂණාගාරය වන ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය ජාතික ඖෂධ නියාමන අධිකාරිය සතු වීම ජාතික ඖෂධ නියාමන අධිකාරියට මහත් ආඩම්බරයකි.

එමෙන්ම 2015 පිහිටවනු ලැබූ ජාතික ඖෂධ නියාමන අධිකාරිය 2017 වර්ෂය වන විට මූල්‍යමය වශයෙන් ස්ථිර වීම හා මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රතිපාදනයකින් තොරව ස්වාධීන වීමට හැකි වීම පිලිබඳ සමස්ත කාර්ය මණ්ඩලය පිලිබඳ සතුටු වෙමි. තවද ඖෂධ සහ ඒ හා සම්බන්ධ අනෙකුත් නිෂ්පාදන මෙන්ම ඖෂධ අලෙවිසල් සඳහා ලබා දෙනු ලබන සහතිකපත්‍ර හා බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමේ අරමුණින් පද්ධති ජාලගතකරණය කිරීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය මේ වන විට මූලික පියවර ආරම්භ කර ඇත. එමගින් රටෙහි සෞඛ්‍ය පද්ධතියේ ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය ඍජුවම ඉහළ යනු ඇතැයි මම විශ්වාස කරමි.

ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ නායකත්වය සමගින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය සඳහා සුදුසු නිලධාරින් බඳවා ගෙන මානව සම්පත මනා ලෙස සංවර්ධනය කරමින් සේවක තෘප්තිය තුලින් ආයතනයේ ඉලක්ක කරා ලගා වීමට කාර්ය මණ්ඩලය මෙහෙයවීමට බලාපොරොත්තු වෙමි.

මහාචාර්ය අසිත ද සිල්වා

සභාපති

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

# ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ පණිවිඩය

මම දකුණු ආසියාවේ වේගයෙන්ම වර්ධනය වන ඖෂධ නියාමන අධිකාරියක් වන ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරියා වන අතර එහි 2019 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම ආඩම්බර වෙමි. ආරම්භයේ සිටම අපි අපගේ කණ්ඩායමේ සාමාජිකයින් අතර අපගේ දැක්ම, මෙහෙවර සහ ඉලක්ක හඳුනාගෙන, අවබෝධ කර ගෙන බෙදාහදා ගත් අතර, එය සියලු උත්සාහයන් පිටුපස ඇති අමිල ශක්තියකි.අප සියලු දෙනාම එක්ව, මහ පෙන්වීමක් ලෙස පස් අවුරුදු ආයතනික සැලැස්මක් සකස් කර ඊට එකඟ විය. අපගේ දූරදර්ශී නායකයන් වන සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු දොස්තර රාජිත සේනාරත්න මහතා, ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි සභාපති මහාචාර්ය අසිත ද සිල්වා මහතා සහ අධිකාරියේ සාමාජික මණ්ඩලය විසින් අපට මනා මෙහෙයවීමක් සහ මඟ පෙන්වීමක් ලබා දෙන ලදී.

මෙම වසරේදී ද, ජාතික ඖෂධ නියාමන අධිකාරිය සිය දෛනික කටයුතු මඟින් පිරිවැටුමේ සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. ඖෂධ නියාමකයෙකු ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පිළිගැනීම සඳහා ඇති ප්‍රධාන සුදුසුකමක් වන මහා භාණ්ඩාගාර අරමුදල්වලින් ස්වාධීන වීමට මෙම වර්ධනය බෙහෙවින් දායක වී ඇත.

අධිකාරියේ පිරිවැටුම ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ සැකසුම් ගාස්තු, ලියාපදිංචි, නියැදි බලපත්‍ර, ආනයන බලපත්‍ර, නිෂ්පාදන බලපත්‍ර සහ වෛද්‍ය උපකරණ සහ ඖෂධ සඳහා ලබා දෙනු ලබන තාවකාලික සහ සම්පූර්ණ ලියාපදිංචියන්හි ආදායම මත ය.

මෙම වර්ෂයේදී ද, ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ දායකත්වයෙන් තොරව අධිකාරිය විසින් සැලකිය යුතු ආදායමක් වාර්තා කර ඇත. තවද, ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි ශුද්ධ ආදායමෙන් භාණ්ඩාගාර බදු හා ආදායම් බදු ගෙවීම මඟින් මහා භාණ්ඩාගාරයට දායක වීමට හැකිවීම ගැන මම මහත් ආඩම්බර වෙමි.

අපගේ අධිකාරියෙහි අනාගතය වෙනුවෙන් **වන** උපායමාර්ගික අරමුණ වන්නේ අධිකාරියේ ව්‍යවස්ථාමය වැඩ රාමුව ශක්තිමත් කිරීම බව අප විසින් හඳුනාගෙන ඇත්තෙමු. මෙහෙයුම් ඵලදායිතාව වැඩි දියුණු කිරීම, මූල්‍ය කාර්ය සාධනය සහ ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම, මානව ප්‍රාග්ධනය වර්ධනය කිරීම, තොරතුරු තාක්ෂණ පද්ධතිවල නවීන ක්‍රම භාවිතා කිරීම සහ මෙහෙයුම් ඵලදායිතාව වැඩිදියුණු කිරීම මගින් එම අරමුණු සපුරා ගැනීමට මම පූර්ණ වශයෙන් කැපවී සිටිමි.



**වෛද්‍ය කමල් ජයසිංහ**
( MBBS, DFM, MSc-Med, Admin, MCMA, MBA, DIPPCA )
ප්‍රධාන විධායක නිලධාරී / අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ඖෂධ නියාමන අධිකාරිය

# අධ්‍යක්ෂ මණ්ඩලය

1. මහාචාර්ය අසිත ද සිල්වා මහතා - සභාපති
2. වෛද්‍ය කමල් ජයසිංහ මහතා
3. වෛද්‍ය එන්. රත්නසේන මහතා
4. සී. හේරත් මිය
5. අජිතා බටගොඩ මිය
6. වෛද්‍ය අනිල් ජාසිංහ මහතා
7. වෛද්‍ය ලක්කුමාර් ප්‍රනාන්දු මහතා
8. ආචාර්ය කපිල රණසිංහ මහතා
9. වෛද්‍ය නිශ්ශංක ජයවර්ධනය මහතා
10. වෛද්‍ය සනත් ලැනරෝල් මහතා
11. වෛද්‍ය ආනන්ද විජේවික්‍රම මහතා
12. වෛද්‍ය පාලිත අබේකෝන් මහතා
13. වෛද්‍ය නිතුෂි සමරනායක මිය

# 1 වන පරිච්ඡේදය

# ආයතනික පැතිකඩ / විධායක සංක්ෂිප්තය

## 1.1 හැඳින්වීම

ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) යනු සියලු වර්ගවල ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති එකම රාජ්‍ය ආයතනයයි. එමෙන්ම මහජනතාවට දැරිය හැකි මිලකට රට තුළ අලෙවි කෙරෙන සියලුම ඖෂධ නිෂ්පාදනවල ගුණාත්මකභාවය, සඵලත්වය සහ සුරක්ෂිතතාවය සහතික කිරීම සම්බන්ධයෙන් වගකියනු ලබන ආයතනයද වේ.

රට තුළ බෙදා හරින ලද සියලුම ඖෂධ, වෛද්‍ය උපකරණ සහ විලවුන් නියාමනය කිරීමේ නීතිමය රාමුව 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත (CDD Act) සහ 1984 විලවුන්, උපකරණ සහ ඖෂධ රෙගුලාසි සහ 1980 සිට 2015 ජූලි දක්වා නිකුත් කරන ලද සංශෝධන මගින් සපයා ඇත. තවද, ජාතික ඖෂධ ප්‍රතිපත්තිය; විලවුන්, උපකරණ සහ ඖෂධ පනත මඟින් සකස් කරන ලද අතර 2007 වසරේදී ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. ඉහත පනත් ප්‍රතිස්ථාපනය කරමින් 2015 වසරේදී මෙම කරුණ වෙනුවෙන් 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත (NMRA Act) පාර්ලිමේන්තුවේදී සම්මත කරනු ලැබීය.

ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතට අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරිය 2015 මාර්තු මස සිට ස්ථාපිත වූ අතර, එය සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ අර්ධ ස්වාධීන ආයතනයක් ලෙස 2015 ජුලි 01 වෙනි දින සිට රාජකාරීන් ආරම්භ කරන ලදී. ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත යටතේ ස්වාධීන අධිකාරියක් ලෙස ශ්‍රී ලංකාවේ රෝගීන්ට ලබා දෙන සියලුම ඖෂධ හා සම්බන්ධ නිෂ්පාදිතයන්හි සුරක්ෂිතභාවය, ගුණාත්මකභාවය, සඵලත්වය සහ සුලභත්වය පිලිබඳ උපකල්පනය කරමින් ස්වයං තීරණ ගැනීමේ සහ එම අධිකාරියෙහි කාර්යයන් පාලනය කිරීමට හැකියාවක් මෙම ආයතනය සතුය.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය ආරම්භයේදී, සංවිධාන ව්‍යුහය නිසි ලෙස සටහන් කර නොතිබුණද, පහත දැක්වෙන අංශයන්ගෙන් එය සමන්විත බව හඳුනාගත හැක.

- ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL)
- ඖෂධ නියාමන අංශය
- අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය
- මූල්‍ය අංශය
- පරිපාලන අංශය
- නීති අංශය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

ඒ අනුව, තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සහාය වීමට කමිටු කිහිපයක්ද අධිකාරිය තුළ වේ. ඖෂධ (MEC), වෛද්‍ය උපකරණ (MDEC), සීමාස්ථ නිෂ්පාදන (BPEC), සායනික පර්යේෂණ (SCOCT) සඳහා ඇගයීමේ කමිටු, සහ සියලු ඖෂධ නිෂ්පාදිතයන්හි ආරක්ෂාව, ගුණාත්මකභාවය සහ සඵලතාවය හා මහජනතාවට දැරිය හැකි මිලකට ලබා ගත හැකි බව සහතික කිරීමට හා වගකීම සඳහා වෙළඳපල මිල නියාමනය කිරීමට මිල නියම කිරීමේ කමිටුව (Pricing Committee) ස්ථාපිත වේ. මීට අමතරව, මහජනතාවට විවෘත වූ අභියාචනා කමිටුවක් සහ ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා උපදේශක කමිටුවක් ද ඇත.

තවද, නීතිමය අවශ්‍යතා ලෙස ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත මඟින් යහපත් නිෂ්පාදන පරිචයන් (GMP), යහපත් බෙදාහැරීමේ පරිචයන් (GDP) සහ යහපත් ඖසුසල් පරිචයන් (GPP) ලෙස ක්‍රියා කරයි.

## 1.2 සංවිධානයේ දැක්ම , මෙහෙවර සහ අරමුණු

### 1.2.1 සංවිධානයේ දැක්ම

**"ගුණාත්මක බව සහතික කළ ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂණ නිෂ්පාදන සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම."**

### 1.2.2 සංවිධානයේ මෙහෙවර

**"ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂණ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ආරක්ෂාව හා කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා නියාමන අධීක්ෂණ සහ සාධක පදනම් තීරණ රෝගීන්ගේ යහපත සඳහා ලබා දීම."**

### 1.2.3 අධිකාරියේ අරමුණු

(අ) ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවරදි තත්වයෙන් යුතු ඖෂධ, ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්වයෙන් යුතු වෛද්‍ය උපකරණ සහ ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්වයෙන් යුතු සීමාස්ථ නිෂ්පාදන සාධාරණ මිලකට මහජනතාවට ලබා දෙන බවට තහවුරු කිරීම.

(ආ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම, ලියාපදිංචිය හෝ බලපත්‍ර අවලංගු කිරීම, නිෂ්පාදනය කිරීම, මිල නියම කිරීම, ආනයනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, බෙදා හැරීම, විකිණීම, ප්‍රචාරණය කිරීම සහ බැහැර කිරීම හා සම්බන්ධ සියලු කාරණා සඳහා මධ්‍යම නියාමක ලෙස කටයුතු කිරීම.

(ඇ) ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන සහ විමර්ශනාත්මක ඖෂධීය නිෂ්පාදන ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම සහ ආනයනය කිරීමට අදාළ සියලු කටයුතු විනිවිදභාවයකින් යුතුව, තිරසාර ලෙස සහ සාධාරණ ආකාරයට සිදුකරන බවට තහවුරු කිරීම.

(ඇ) අත්‍යාවශ්‍ය ඖෂධ සාධාරණ මිලකට පැවතීම සහතික කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ නිවැරදි තත්වයෙන් යුතු ඖෂධ නිෂ්පාදනය දිරිමත් කිරීම.

(ඉ) සෞඛ්‍ය සත්කාර වෘත්තිකයන් හා පාරිභෝගිකයන් විසින් ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ආරක්ෂාකාරී ලෙස සහ විචාරශීලී ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීම.

(ඊ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදනවලට සම්බන්ධිත අදාළ නීති සඳහා උචිත සංශෝධන නිර්දේශ කිරීම.

(උ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන පිළිබඳ මහජනතාව, සෞඛ්‍ය සත්කාර වෘත්තිකයන් සහ ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන සියලු දෙනා දැනුවත් කිරීම.

(ඌ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ප්‍රවර්ධනය සහ අලෙවිකරණය නියාමනය කිරීම.

(එ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන පැවතීම නියාමනය කිරීම.

(ඒ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදනවල තත්ත්වය, ආරක්ෂාකාරී බව සහ අහිතකර ප්‍රතික්‍රියාවන් පිළිබඳව පශ්චාත් අලෙවිකරණ සමීක්ෂණ පැවැත්වීම.

(ඔ) ශ්‍රී ලංකාවේ සායනික පරීක්ෂණ පැවැත්වීමට අදාළ සියලු කටයුතු නියාමනය කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- නව ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ත නිෂ්පාදන ලියාපදිංචි කිරීම.
- වෙළඳපොලේ දැනටමත් ලියාපදිංචි නිෂ්පාදනවල සංශෝධනය කිරීම් නියාමනය කිරීම
- යහපත් නිෂ්පාදන පරිචයන් අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම
- වෙළඳපලේ ඇති ඖෂධ නිෂ්පාදිත සහ වෙළඳ දැන්වීම් සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරී වීම
- සායනික පරීක්ෂණ නියාමනය සහ අධීක්ෂණය කිරීම.
- ඖෂධ නිෂ්පාදන අපනයනය කිරීම සඳහා යහපත් නිෂ්පාදන සහතික කිරීම
- යහපත් ඖෂධවේදාත්මනය පරිචයන් බලාත්මක කිරීම
- වෙළඳපලේ ඇති ඖෂධීය නිෂ්පාදන පරීක්ෂා කිරීම සහ නීතිය බලාත්මක කිරීම

## 1.4 පිරිස් ප්‍රතිපාදනය

| සේවක වර්ගීකරණය | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු / අතිරික්තය |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| | අධ්‍යක්ෂ | 04 | 01 | 03 |
| | අධ්‍යක්ෂ (මානව සම්පත්) | 01 | - | 01 |
| | වෛද්‍ය නිලධාරී | 04 | - | 04 |
| | ගණකාධිකාරී | 01 | 01 | - |
| | අභ්‍යන්තර විගණක | 01 | - | 01 |
| | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | 06 | 01 | 05 |
| | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු සන්නිවේදන තාක්ෂණ) | 01 | 01 | - |
| | පිරිවැය ගණකාධිකාරී | 01 | - | 01 |
| | නීති නිලධාරී | 01 | 01 | - |
| | ඖෂධ විශ්ලේෂක | 13 | 06 | - |
| තෘතීයික මට්ටම | පරිපාලන නිලධාරී | 01 | 01 (වැඩ බලන) | 01 |
| | පිරිවැය නිලධාරී | 05 | - | 05 |

| | | | | |
|---|---|---|---|---|
| ද්විතියික මට්ටම | ඖෂධවේදී | 70 | 52 (තාවකාලික / ද්විතියන ) | 70 |
| | සංවර්ධන නිලධාරී | 10 | 07 | 03 |
| | ඖෂධ පරීක්ෂක | 20 | 03 ( ද්විතියන ) | 20 |
| | තාක්ෂණික නිලධාරි (සිවිල්) | 01 | - | 01 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 01 | 01 ( ද්විතියන ) | 01 |
| | කළමනාකරණ සහකාර | 43 + (කොන්ත්‍රාත් පදනම 10) | 23 (ස්ථිර) 04 ( ද්විතියන පදනම) 02 (කොන්ත්‍රාත්) | 20 |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | 10 | 08 (ද්විතියන 03 /ස්ථිර 05) | 05 |
| | ජලනල කාර්මික | 01 | 01 | - |
| | විදුලි කාර්මික | 01 | 01 | - |
| | රසායනාගාර සහකාර | 08 | 02 ( ද්විතියන පදනම) | 08 |
| | කාර්යාල කාර්ය සහයක | 30 | 24 | 06 |
| | **සමස්ත** | **245** | **141** | **155** |

## 1.5 ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ පවතින අංශ

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මනා ක්‍රියාකාරිත්වය පිණිස එහි පහත පරිදි අංශ ස්ථාපිත කර ඇත.

1. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL)
2. ඖෂධ නියාමන අංශය
3. අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය
4. මූල්‍ය අංශය
5. පරිපාලන අංශය
6. නීති අංශය
7. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

## 1.5.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL)

### 1.5.1.1 හැඳින්වීම

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NDQAL) යනු විලවුන්, ඖෂධ උපකරණ සහ ඖෂධ පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ජාතික රසායනාගාරයයි. එය 1980 අංක 27 දරණ විලවුන්, උපකරණ සහ ඖෂධ පනත යටතේ නොර්වේජියානු උපදේශන සහ NORAD අරමුදල් මඟින් 1990 දී ස්ථාපිත කරන ලද අතර, ශ්‍රී ලංකාව තුළ පවතින ඉහත නිෂ්පාදනවල ගුණාත්මකභාවය, සුරක්ෂිතභාවය සහ සඵලත්වය සහතික කිරීමේ අරමුණ ඇතිව පිහිටුවා ඇත.

2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත මඟින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) 2015 ජුලි 1 දින සිට ස්ථාපිත වූ අතර, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NDQAL) එම නව අධිකාරිය යටතට පත් කරන ලදී. එබැවින් වර්තමානය වන විට ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NDQAL) ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අතර, එය ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) ලෙස නම් කර ඇත.

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි ප්‍රධාන අංශ වන්නේ රසායනික, ක්ෂුද්‍රජීව, ජීව විද්‍යාත්මක, විමර්ශන ප්‍රමිතිය සහ ක්‍රමාංකනය සහ උපකරණ ය. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය විසින් සම්මත පරීක්ෂණ ක්‍රියාපටිපාටීන් සහ ගුණාත්මකභාවය සුරක්ෂිතතාවය හා සඵලතාවය තක්සේරු කිරීමේදී පිළිගත් (වලංගු) පරීක්ෂණ ක්‍රියා පටිපාටි අනුගමනය කරයි.

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය අවශ්‍ය වන විට අතිරේක අනුමත විශ්ලේෂකයෙකු ලෙස ක්‍රියා කරයි.

1.5.1.2 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි ආංශික ව්‍යුහය




*Note: due to lack of qualified staff following amendments were made to approved organization Structure.

1. Biological tests are not carried out at present.
2. Staff of former Biological, Ref. Std & Calibration, Devices and Cytosis Division are merged temporarily under the name of 'Biological Division'. Accordingly, Chemical Tests, Physical Tests, Particulate Matter Tests are conducted by this division.

1.5.1.3 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි ප්‍රධාන කාර්යයන්

ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන සහ විලවුන් පිළිබඳ තත්ත්ව සහතික කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂනාගාරය (NMQAL) විසින් සපයයි. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි මූලික කාර්යය වන්නේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය, සුරක්ෂිතතාවය සහ සඵලතාවය අවශ්‍යතාවයන්ට අනුකූලද යන්න තීරණය කිරීම සඳහා අවශ්‍ය රසායනාගාර පරීක්ෂණ පැවැත්වීමයි. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි කාර්යයන් වනුයේ,

- දේශීයව නිෂ්පාදනය කරනු ලබන හා ආනයනය කරනු ලබන ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන හා විලවුන් බෙදා හැරීමේ දාමයෙහි විවිධ වූ ස්ථානයන්හිදී විශ්ලේෂණය කිරීම.(පූර්ව හා පශ්චාත් වෙළඳ සමීක්ෂණ අදියරයන්). ලියාපදිංචි නියැදි, පැමිණිලි නියැදි, ටෙන්ඩර් නියැදි, පූර්ව නැව්ගත කිරීමේ නියැදි, පූර්ව බෙදාහැරීමේ නියැදි සහ උසාවි මඟින් ලැබෙන නියැදි ලෙස නියැදි පරීක්ෂණාගාරය වෙත ලැබේ. ඊට අමතරව, රජයේ සහ පෞද්ගලික අංශයන් මඟින් සමීක්ෂණ නියැදි රැස් කරනු ලබයි.
- ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීමසඳහා ඇගයීම් කිරීමේදී අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විටදී තාක්ෂණික උපදෙස් ලබා දීම.
- යහපත් නිෂ්පාදන පරිචයන් පරීක්ෂාකිරීම සඳහා සහභාගී වීම.

- බාහිර තත්ත්ව සහතික කිරීමේ ඇගයීම් වැඩසටහන් වලට සහභාගී වීම (ප්‍රවීණතා පරීක්ෂණ)
- තත්ත්ව සහතික කිරීමේ පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් තීරණය කරන ලද පරිදි දේශීය හෝ විදේශීය රසායනාගාරවල සේවාවන් අවශ්‍ය යැයි සලකන විට ඒවා සම්බන්ධීකරණය කිරීම.

## 1.5.2. ඖෂධ නිෂ්පාදන නියාමන අංශය

### 1.5.2.1 හැඳින්වීම

නිෂ්පාදනවල සුරක්ෂිත බව, සඵලත්වය, ගුණාත්මක බව හා ඒවායේ මිල පෙරදැරි කරගෙන රෝගීන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ භාවිතා කරනු ලබන ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන නියාමනය කිරීමට අමතරව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) ඖෂධ නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තශාලා සහ දීපව්‍යාප්ත ඖෂධහල් නියාමනය කිරීමටද මැදිහත් වේ. ඖෂධ හා අදාල නිෂ්පාදන වලින් සිදුවන අහිතකර ප්‍රතිඵල අවම කිරීමට ඖෂධ බලපෑම් පිලිබඳ පසු විපරම ( Pharmacovigilance) ද අදාළ අංශය මඟින් සිදුකරනු ලබයි.

### 1.5.2.2 ඖෂධ නිෂ්පාදන නියාමන අංශයේ ආංශික ව්‍යුහය




### 1.5.2.3 ඖෂධ නිෂ්පාදන නියාමන අංශයේ කාර්යයන්

ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත යටතේ ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදනයන්ට අදාලව පහත සඳහන් දෑ ඇතුළුව සියලුම කාර්යයන් නියාමනය කිරීම;

- දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ඇති ඖෂධ නිෂ්පාදන ස්ථාන.

- නව ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ඇගයීම, ලියාපදිංචි කිරීම සහ ආනයන බලපත්‍ර නිකුත් කිරීම.
- මිල නියාමනය
- දිවයින පුරා පිහිටා ඇති ඔසුසල් නියාමනය කිරීම
- ඖෂධ බලපෑම් පිළිබඳ පසු විපරම ( Pharmacovigilance)

### 1.5.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය

#### 1.5.3.1 හැඳින්වීම

අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය යනු 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත යටතේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පිහිටුවා ඇති අංශයකි.

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) අධීක්ෂණ හා බලාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ අධිකාරිය විසින් බලය පවරනු ලබන සහ විධානය කරනු ලබන පරිදි අධිකාරි පනතේ විධිවිධාන යථාපරිදි ක්‍රියාවට නැංවීමට අදාළ ගැටලු අධීක්ෂණය සහ විමර්ශනය කිරීමයි. මෙම කාර්යයන් ඉටු කිරීම පිණිස ගරු ඇමතිතුමා විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනත යටතේ බලයලත් නිලධාරීන් වශයෙන් ජ්‍යෙෂ්ඨ ආහාර හා ඖෂධ පරීක්ෂණ නිලධාරීන් තිදෙනෙකු මෙම අංශයට පත්කර ඇත. මේ වනවිට මෙම අංශය මෙහෙයවනු ලබන්නේ ප්‍රධාන ආහාර හා ඖෂධ පරීක්ෂක (CFDI) විසිනි.

ආහාර හා ඖෂධ පරීක්ෂණවරුන් අනිකුත් පුද්ගලයින් සමග නිරන්තරයෙන් සම්බන්ධතා පවත්වා ගැනීමට අවශ්‍ය කරනු ලබන රාජකාරි කටයුතු ඉටු කිරීමට වැඩිපුරම ක්ෂේත්‍රයේ සේවය කළ යුතු නිසා ඔවුන් ක්ෂේත්‍ර නිලධාරීන් වශයෙන් සලකනු ලැබේ.

#### 1.5.3.2 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ ආංශික ව්‍යුහය



1.5.3.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ කාර්යයන්

- ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනත යටතේ බලයලත් නිළධාරීන් ලෙස කටයුතු කිරීම
- පශ්චාත් අලෙවි සමීක්ෂණ පැවැත්වීම
- අවශ්‍ය වූ විටෙකදී විධිමත් සහ අවිධිමත් ලෙස නියැදි ලබාගැනීම
- බලපත් නිකුත් කිරීම පිණිස ඖෂධ සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන පරීක්ෂා කිරීම සහ එම ආයතන නිර්දේශ කිරීම
- බලපත් නිකුත් කිරීම පිණිස ඖෂධ ප්‍රවාහනය කරන වාහන පරීක්ෂා කිරීම සහ එම වාහන නිර්දේශ කිරීම
- නිෂ්පාදන ආපසු කැඳවීමේ ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම
- SSFFC විසින් සහ හොර බඩු ජාවාරම්වලින් රඳවාගනු ලැබූ ඖෂධ නිෂ්පාදන සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සහ නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම
- පෞද්ගලික වෙළඳපොලේ රජයට අයත් ඖෂධ ලබාගැනීමේ හැකියාව විමර්ශනය කිරීම
- අන්තරායකර ඖෂධ යෙදවුම් පරීක්ෂා කිරීම සහ නිර්දේශ කිරීම
- අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම
- පනත යටතේ සිදුකරනු ලැබූ උල්ලංඝණය කිරීම්වලට එරෙහිව චෝදනා ඉදිරිපත් කොට කටයුතු කිරීම
- නීතිය බලාත්මක කිරීමේ අනිකුත් නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය සහ සහයෝගයෙන් කටයුතු කිරීම

## 1.5.4 මූල්‍ය අංශය

1.5.4.1 හැඳින්වීම

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) මූල්‍ය අංශයේ කටයුතු 2016.01.01 දින සිට ආරම්භ කරනු ලැබීය. 2016, 2017 හා 2018 වර්ෂයන්හිදී සැලසුම් කළ පරිදි, නව සංවර්ධන නිලධාරින් දෙදෙනෙකු සහ කළමනාකරණ සහකාර නිලධාරින් 08 දෙනෙකු බඳවා ගනු ලැබීය. ඒ අනුව මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලය ගණකාධිකාරී, සංවර්ධන නිලධාරින් 02කු, කළමනාකරණ සහකාර නිලධාරින් 08 දෙනෙකු, පුහුණුලාභීන් 03කු, කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු සහ එක් කාර්යාල කාර්ය සහයකයෙකු ඇතුළුව මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලය 16 දක්වා ඉහල යන ලදී.

1.5.4.2 මූල්‍ය අංශයේ ආංශික ව්‍යුහය



1.5.4.3 මූල්‍ය අංශයේ කාර්යයන්

- ආදායම් මාර්ග දහඅටක් මගින් සියලුම ආදායම් ලබා ගැනීම.
- අවසන් ගිණුම් පිළියෙල කිරීම.
- ඉදිරි වර්ෂය සඳහා අයවැය පිළියෙල කිරීම සහ ඒ සඳහා අනුමැතිය ලබාගැනීම.
- අධිකාරියේ එදිනෙදා ක්‍රියාකාරකම් සිදුකරගෙන යාමට අවශ්‍ය කරනු ලබන සියලුම සැපයුම් පවත්වාගෙන යාම
- සියලුම මුදල් පාලන කටයුතු
- ප්‍රසම්පාදන කටයුතු

## 1.5.5 පරිපාලන අංශය

### 1.5.5.1 හැඳින්වීම

පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ ඖෂධ නිෂ්පාදන නියාමන අංශයේ අනුමැතිය මත සියලුම වර්ගයේ ඖෂධ නිෂ්පාදන සැපයුම්කරුවන්ට බලපත්‍ර සහ ලියාපදිංචි සහතිකපත් නිකුත් කිරීම වේ. මීට අමතරව, ගොඩනැගිලි නඩත්තු කිරීම, විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම, වාහන කළමනාකරණය, වාර සේවා සහ අළුත්වැඩියා කිරීම, සියලු ආකාරයේ බිල්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගැනීම, නිවාඩු සහ අනෙකුත් කාර්ය මණ්ඩල විධිවිධාන පවත්වාගෙන යාම සහ කාර්ය මණ්ඩල සුබසාධනය ඉහළ නැංවීමට කටයුතු කිරීම සිදු කරනු ලැබේ. එමගින් අනෙකුත් ආයතන සමඟ ද විධිමත් සන්නිවේදනයක් ඇති කර ගනිමින් තම ගනුදෙනුකරුවන්ට උසස් තත්ත්වයේ සේවාවක් ලබා දීමට අධිකාරියට හැකියාව ලැබේ.

### 1.5.5.2 පරිපාලන අංශයේ ආංශික ව්‍යුහය



1.5.5.3 පරිපාලන අංශයේ කාර්යයන්

මෙම අංශය පිහිටුවනු ලබන්නේ විශේෂයෙන්ම ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදනවලට බලපත් සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීම ඇතුළුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සියලුම පරිපාලන සහ නඩත්තු ක්‍රියාකාරකම් ආවරණය කිරීමට ය.

ඒ අනුව, පරිපාලන අංශය විසින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- ඖෂධ ලිපිගොනු ඇගයීමෙන් පසුව නිකුත් කරනු ලබන බලපත් (නිෂ්පාදන සහ ආනයන බලපත්), උපකරණ (නිෂ්පාදන සහ ආනයන බලපත්), නියැදි බලපත් සහ ලියාපදිංචි බලපත් නිකුත් කිරීම (ඖෂධ හා උපකරණ), ලියාපදිංචි සහතික සහ බලපත් යතුරුලියනය සහ ඇගයීම්පත් විද්‍යුත් තැපැල ඔස්සේ යැවීම.
- බලපත් සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම
- අධිකාරිය තුළ පිරිස් කළමනාකරණය
- කාර්යාල පරිශ්‍රය නඩත්තු කිරීමට අදාල සියලුම ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම
- උපයෝගිතා සේවා පවත්වාගෙන යාම
- අංශයට සම්බන්ධ අදාල වාර්තා පිළියෙල කිරීම
- වාහන සහ ප්‍රවාහන කළමනාකරණය
- කාර්යමණ්ඩලයේ නිවාඩු (රාජකාරි/දේශීය/විදේශීය) සම්බන්ධයෙන් ඇති කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ස්ථිර සහ පුහුණු කාර්යමණ්ඩලයේ පැමිණීම සහතික කිරීම
- අධිකාරිය සඳහා බාහිර පාර්ශවයන් වෙතින් අවශ්‍ය කරනු ලබන ආරක්ෂක, පවිත්‍රතා, විදුලිය, විදුලි සෝපාන සේවා, වායුසමීකරණ, ඡායා පිටපත් ආදී සේවාවන් ලබාගැනීම සහ සියලුම බිල්පත් ගෙවීම් සිදුකිරීම
- බාහිර සහ අභ්‍යන්තර ලේඛනාගාර අධීක්ෂණය කිරීම
- කාර්යමණ්ඩලය සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම

## 1.5.6. නීති අංශය

1.5.6.1 හැඳින්වීම

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) විෂයපථය තුළ ඇති ප්‍රධාන අංශවලින් එකක් ලෙස 2017 වර්ෂයේදී ස්ථාපනය කරන ලද නීති අංශය හැඳින්විය හැක. ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාද සහ විලවුන් ආනයනකරුවන්, නිෂ්පාදකයින්, බෙදාහරින්නන්, තොග සහ සිල්ලර වෙළෙඳුන් පාලනය කිරීමට අදාලව 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරිය

(NMRA) පනත යටතේ නීති සම්පාදනය කිරීමේදී මෙම අධිකාරියේ නීති අංශය විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

1.5.6.2. නීති අංශයේ ආංශික ව්‍යුහය




1.5.6.3 නීති අංශයේ ප්‍රධාන කාර්යයන්

- ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන සහ විලවුන් සම්බන්ධයෙන් 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනතට යෝග්‍ය සංශෝධන නිර්දේශ කිරීම
- ඇතිවන මාර්ගෝපදේශ/රෙගුලාසි සමාලෝචනය කිරීම සහ ශ්‍රී ලාංකීය සංදර්භයට ගැළපෙන පරිදි යොදා ගැනීම.
- ශ්‍රී ලංකාව තුළ ඵලදායි සහ කාර්යක්ෂම නියාමන පද්ධතියක් සාක්ෂාත් කරගැනීම පිණිස පවත්නා රෙගුලාසි වැඩිදියුණු/සංශෝධනය කිරීම
- අලෙවිකරණ සඳහා බලය ලැබෙන ආයතන මාරු කිරීම.
- නීතිපති දෙපාර්තමේන්තුවෙන් නීති උපදෙස් ලබාගැනීම හා නීති උපදෙස් සැපයීම
- තොරතුරු දැනගැනීමේ පනතට අදාල ඉල්ලුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ සම්බන්ධීකරණය

## 1.5.7 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අංශය

1.5.7.1 හැඳින්වීම

තොරතුරු හා සන්නිවේදන අංශය 2019 දී ආරම්භ කරන ලද අතර එක් සංවර්ධන නිලධාරියෙකු සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)ගේ අධීක්ෂණය යටතේ කටයුතු සිදු කරයි. ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලියට (e-NMRA) සමගාමීව, 2019 ඔක්තෝම්බර් මාසයේදී සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) බඳවා ගන්නා ලදී. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ දැක්ම වනුයේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ව්‍යාපාර සහ සේවා සපුරාලීම සඳහා කාර්යක්ෂම, ආරක්ෂිත, විශ්වාසනීය සහ තිරසාර තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සැපයීමයි. ප්‍රාදේශීය

ජාලකරණය (LAN), පරිගණක දෘඩාංග සහ මෘදුකාංග කළමනාකරණය, දත්ත පද්ධතිය, වෙබ් අඩවිය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රසම්පාදන පරිපාලනය ඇතුළු තොරතුරු සහ සන්නිවේදන කළමනාකරණය සඳහා මෙම අංශය වගකිව යුතු අතර, අවශ්‍ය පරිදි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධයෙන්ද ක්‍රියා කරයි. පවත්නා ජාලය පුළුල් කරමින් ආයතනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා දත්ත මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය සැලසුම් කරනු ලබයි. සපයනු ලබන සේවාවන්හි විනිවිදභාවය, ප්‍රතිචාර දැක්වීම සහ වගවීම වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය සැලසුම් කරයි. මෙම කාර්යයන් ඉටු කිරීමේදී ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිකම අංශය මුහුණපානු ලබන ප්‍රධාන ගැටලුව වන අතර නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම මඟින් මෙම ගැටලුව මගහරවා ගැනීමට හැකියාව පවතී.

### 1.5.7.2 තොරතුරු තාක්ෂණ අංශයේ ආංශික ව්‍යුහය



# 2 වන පරිච්ඡේදය

# ප්‍රගතිය සහ දැක්ම

අර්ධ ස්වාධීන, විශේෂිත ඖෂධ නියාමන අධිකාරියක් ස්ථාපිත කිරීමේ රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස, 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත මඟින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවන ලදී. එහි වගකීම වන්නේ සුරක්ෂිතබව, සඵලත්වය, ගුණාත්මකභාවය සහ මිල කරණය සලකමින් මහජනතාවගේ වුවමනාවන් සාක්ෂාත් කිරීම පිණිස ඖෂධ නිෂ්පාදන (ඖෂධ, වෛද්‍ය උපකරණ සහ විලවුන්) නියාමනය කිරීමයි.

අධිකාරිය පිහිටුවනු ලැබූ මුල් වර්ෂවලදී එහි අරමුණු සාක්ෂාත් කිරීමේදී බොහෝ අඩුලුහුඩුකම් තිබුණි. එසේ තිබියදී වුවද රට වෙනුවෙන් විශිෂ්ඨ සේවයක් ලබාදීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියට හැකිවිය.

## 2.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි (NMQAL) ප්‍රගතිය

රු . 55,465,060.00 ක් වටිනා පහත සඳහන් රසායනාගාර උපකරණ මිලදී ගෙන ඇත.

1) High Performance Liquid Chromatography (HPLC), 2) Potentiometric Titrator, 3) Vacuum Oven, 4) Refractometer 5) Ultrasonic cleaner, 6) Laboratory Shaker, 7) Dehumidifier 8) Horizontal LAF cabinet 9) Manual Dimension Tester and 10) Visual Leak Tester.

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාර නිලධාරීන් දේශීය හා විදේශීය යහපත් නිෂ්පාදන පරිචයන් පරීක්ෂණ සඳහා සහභාගී වීම.

ඉන්දියාවෙහි වෛද්‍ය සුචේතා බැනර්ජී විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය සඳහා ගුණාත්මක තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයක් ඇති කිරීම පිණිස පරීක්ෂණාගාරයේ පිහිටුවීම වැඩිදියුණු කිරීමට සහ පහසුකම් ගොඩනැගීම හෝ විස්තාරණය කිරීම (හෝ නව)හෝ පහසුකම් එකතු කිරීමට අදාලව තෙදින වැඩමුළුවක් (2018 පෙබරවාරි 14 සිට 16 දක්වා ) පවත්වන ලදී.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතකරණය (WHO Benchmark) ක්‍රියාත්මක කිරීම - 2019 ජුනි 04

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් පුහුණු වැඩසටහන් සැලසුම් කරන ලදී.

- ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාර කාර්ය මණ්ඩලය සඳහා ගිනි නිවීම පිළිබඳ දැනුවත් කිරීම (2019.ජුනි 20 සහ 2019 ජුනි 27).
- ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාර කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ වැඩමුළුව (2019 ජූලි 25)

- ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාර කාර්ය මණ්ඩලය සඳහා ISO 17025 වැඩමුළුව (2019 ජූලි 26)
- ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාර කාර්ය මණ්ඩලය සඳහා ISO 9001 පුහුණුව (2019 ජූලි 22)
- ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා මිනුම් අවිනිශ්චිතතා පුහුණුව (2019 නොවැම්බර් 21)

ලෝක සෞඛ්‍ය සංවිධාන ප්‍රමිතකරණය (WHO benchmarking) (2019 නොවැම්බර්)

ISO 17025 අයදුම්පත ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත (SLAB) ඉදිරිපත් කර ඇත.

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාර නිලධාරීන් දේශීය හා විදේශීය යහපත් නිෂ්පාදන පරිචයන් (GMP) පරීක්ෂණ සඳහා සහභාගී වීම.

රුහුණු විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය , කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය සහ විවෘත විශ්වවිද්‍යාලයෙන් ඖෂධවේදී සහ විද්‍යාවේදී ඖෂධවේදී උපාධි අපේක්ෂකයින් පුහුණු කරන ලදී.

**අනාගත සැලසුම්:**

1) විවිධ විද්‍යාත්මක පසුබිම් සහ ඉහළ සුදුසුකම්ලත් කාර්යක්ෂම තාක්ෂණික කාර්යමණ්ඩයලක් හා අනිකුත් සහයක කාර්යමණ්ඩලයක් බඳවා ගැනීම.
2) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සංවිධාන ව්‍යුහයට ගැළපෙන පරිදි ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ සංවිධාන ව්‍යුහයක් පිළියෙල කිරීම.
3) පශ්චාත් අලෙවිකරණ අදියරේදී නියැදි වැඩි ප්‍රමාණයක් විශ්ලේෂණය කිරීම නැවත ආරම්භ කිරීම.
4) දේශීය නියෝජිතයින් විසින් ලබාදෙන සහයෝගය ප්‍රමාණවත් නොවන නිසා නවීන හා ඉහළ සංවේදිතාවකින් යුත් විශ්ලේෂක උපකරණ නඩත්තු කිරීමේ ක්‍රියාපටිපාටියක් පිළියෙල කිරීම.
5) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සියලුම විද්‍යාගාර අවශ්‍යතා සඳහා (උපකරණ, රසායනික ද්‍රව්‍ය, ද්‍රාවණ, ප්‍රතිකාරක, මූලික හා අනිකුත් ප්‍රමිතීන්, වීදුරු භාණ්ඩ හා අනිකුත් උපාංග ආදිය) ප්‍රසම්පාදනය කිරීම පිණිස වෙනම ප්‍රසම්පාදන ඒකකයක් ස්ථාපනය කිරීම.
6) වඩාත් හොඳ සේවයක් ලබාදීම පිණිස අභ්‍යන්තර සන්නිවේදනය/ක්‍රියාපටිපාටීන්/සහයෝගය ශක්තිමත් කිරීම.
7) ISO 17025 පිළිගැනීම සාක්ෂාත් කරගැනීම සඳහා සහ/හෝ ලෝක සෞඛ්‍ය සංවිධානයේ පූර්ව සුදුසුකම් තත්ත්වය ලබාගැනීම පිණිස විද්‍යාගාර ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම.

| නියැදි වර්ගය | සමත් | අසමත් රඳවා ගැනීම්/ ආපසු ගැනීම් | දැනටමත් ආපසු ගැනීම් | සිදු නොකරන ලද | එකතුව |
|---|---|---|---|---|---|
| **පැමිණිලි** | 90 | 88 | 5 | 32 | 215 |
| **විධිමත්** | 40 | 2 | - | 16 | 58 |
| **අවිධිමත්** | 18 | 3 | - | 1 | 22 |
| **රසායනාගාර ඉල්ලීම්** | 1 | 0 | - | - | 1 |
| **නිෂ්පාදක ඉල්ලීම්** | - | - | - | - | 0 |
| **ලියාපදිංචි කිරීම්** | 45 | 14 | - | 1 | 60 |
| **SPC ටෙන්ඩර** | 14 | 2 | - | - | 16 |
| **වෙනත්** | 16 | 5 | - | - | 21 |
| **සමීක්ෂණ** | 36 | 12 | - | - | 48 |
| | **260** | **126** | **5** | **50** | **441** |

නිකුත් කරන ලද තත්ත්ව සහතිකයේ ගණන = 441-50
= 391

නිකුත් කරන ලද අසමත් වාර්තා ගණන = 126

2019 වර්ෂය තුළදී නිකුත් කරන ලද වාර්තාවලින් තත්ත්ව අසමත් ප්‍රතිශතය (%) = 32

## 2.2 ඖෂධ නිෂ්පාදන නියාමන අංශයේ ප්‍රගතිය

ඖෂධ නියාමන අංශයේ දෛනික රාජකාරි කටයුතු අවම මානව සම්පතක් තිබියදීත් උපරිම කාර්යක්ෂමතාවයකින් සම්පූර්ණ කර ඇත. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වගකීම් ඉටුකරනු පිණිස සියලුම නියාමන වැඩ, බහුවිධ වැඩ කාර්යභාරයන් සහිත සියලුම නියාමක ඖෂධවේදීන් විසින් ඉටුකරනු ලබන අතර වර්ෂය සඳහා විවිධ කාර්යභාරයන් සම්බන්ධයෙන් කණ්ඩායම් සංවර්ධනය කිරීම පිණිස සාකච්ඡාවන් පවත්වන ලදී.

අනාගත සැලසුම්

1) අවශ්‍ය මානව සම්පත බඳවා ගැනීම (ඖෂධවේදීන්, කළමනාකරණ සහකාරුවන්, කාර්යාල කාර්ය සහයකයින්)
2) කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම පිණිස සමාන වැඩ කාර්යභාරයන් සහිත කණ්ඩායම් ඇති කිරීමට අංශය, උප අංශවලට බෙදීම
3) අංශයේ අධි ක්‍රියාකාරිත්වය අඩු කිරීමට හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට විද්‍යුත් පද්ධති අවශ්‍යතා ඉටු කිරීම

## 2.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ ප්‍රගතිය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මූලික අරමුණ දිවයිනේ ඖෂධ නිෂ්පාදනවල සුරක්ෂිත බව, ගුණාත්මක බව හා සඵලත්වය සහතික කිරීම වන නිසා මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම පිණිස අධීක්ෂණ හා බලාත්මක කිරීමේ අංශය ක්‍රියාකාරීව මැදිහත් වේ.

විවිධාකාරයේ උල්ලංඝනය කිරීම් හඳුනා ගැනීම හා නීතිමය පියවර ගැනීම මෙම ඒකකය විසින් දියත් කරනු ලබයි.

පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා නීතිය මෙම අංශ විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම අංශයේ නිලධාරීන් නීතිය බලාත්මක කිරීමේ අනිකුත් නියෝජිතායතන (පොලීසිය/රේගුව/යුධ හමුදාව/ජාතික අන්තාරයකර ඖෂධ පාලන මණ්ඩලය) සමඟ සමීපව කටයුතු කරති.

මිල රෙගුලාසි ක්‍රියාත්මක කිරීම - 2019

| අනුක්‍රමික අංකය. | ස්ථානය/දිස්ත්‍රික්කය | වරදෙහි ස්වභාවය | ගන්නා ලද පියවර | | |
|---|---|---|---|---|---|
| | | | අධිකරණය | ප්‍රතිඵලය (දඩය) | වෙළඳ දැන්වීම |
| 01 | බදුල්ල | Pregablin 150mg කැප්සියුල මිල ඉක්මවා විකිණීම . | බදුල්ල | රු.10,000.00 | ඔව් |
| 02 | බදුල්ල | Glimepiride 1mg පෙති මිල ඉක්මවා විකිණීම. | බදුල්ල | රු.35,000.00 | නැත |
| 03 | බණ්ඩාරවෙල | Pregablin 75mg කැප්සියුල මිල ඉක්මවා විකිණීම . | බණ්ඩාරවෙල | රු.10,000.00 | නැත |
| 04 | බණ්ඩාරවෙල | Gabila 75mg කැප්සියුල මිල ඉක්මවා විකිණීම . | බණ්ඩාරවෙල | රු.10,000.00 | නැත |

| | | | | | |
|---|---|---|---|---|---|
| 05 | බණ්ඩාරවෙල | Seromax කැප්සියුල මිල ඉක්මවා විකිණීම . | බණ්ඩාරවෙල | රු.10,000.00 | නැත |
| 06 | බණ්ඩාරවෙල | Pregablin 150mg කැප්සියුල මිල ඉක්මවා විකිණීම . | බණ්ඩාරවෙල | රු.10,000.00 | ඔව් |
| 07 | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | Losartan පෙති මිල ඉක්මවා විකිණීම. | කොටුව | රු.75,000.00 | ඔව් |

| අංක | උල්ලංඝනය කිරීම | ස්ථානය සහ දඩ නියම කිරීම | | | | | සමස්ත නඩු | මුළු දඩ මුදල් ( රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| | | NMRA ප්‍රදේශය | දඩ පැනවීම | | වෙනත් ප්‍රදේශ | දඩ පැනවීම | | |
| **01** | අනිසි ඖෂධ සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති උල්ලංඝනයන් (Tramadol සහ Pregablin ආදිය ) | 106 | 1,516,500.00 | | 17 | 1,315,000.00 | **123** | 2,831,500.00 |
| | | | | | | | | |
| **02** | ඖෂධවේදියාගේ සෘජු අධීක්ෂණයකින් තොරව ඖෂධ විකිණීම -120(3) | 02 | 45,000.00 | | 01 | 1,500,00.00 | **03** | 1,950,00.00 |
| **03** | තොග බෙහෙත් ගබඩා කිරීම (106 (1) | 04 | 500,000.00 | | 04 *(පොරොත්තු -02)* | 90,000.00 | **08** | 5,900,00.00 |
| **04** | උපරිම සිල්ලර මිල (MRP) ඉක්මවා මිල පාලන ඖෂධ අලෙවි කිරීම | 01 | 75,000.00 | | 05 | 70,000.00 | **06** | 145,000.00 |
| **05** | බලපත්‍රයක් නොමැතිව ඔසුසල් පවත්වාගෙන යාම | 03 | 130,000.00 | | 10 | 5,500,00.00 | **13** | 6,800,00.00 |
| **06** | බෙහෙත් වට්ටෝරුවකින් තොරව ඖෂධ විකිණීම | 01 | 20,000.00 | | 06 | 3,85,000.00 | **07** | 1,350,00.00 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **07** | ලියාපදිංචි නොකළ උපකරණ ආනයනය කිරීම | 01 | 10,000.00 | | - | - | **01** | 10,000.00 |
| **08** | ලියාපදිංචි නොකළ සීමාස්ථ නිෂ්පාදන ආනයනය කිරීම | 01 | 25,000.00 | | - | - | **01** | 25,000.00 |
| **09** | බලපත්‍රයක් නොමැතිව සීමාස්ථ නිෂ්පාදන ගබඩා කිරීම | 01 | 25,000.00 | | - | - | **01** | 25,000.00 |
| **10** | බලපත්‍රයක් නොමැතිව ඖෂධ ගබඩා කිරීම | 02 | 2,750,00.00 | | - | - | **02** | 2,750,00.00 |
| | විලවුන් ලියාපදිංචි ආදායම | 7,863,500 | 9,264,775 |
| | රසායනාගාර පරීක්ෂණ සඳහා ගාස්තු | 7,921,631 | 5,526,579 |
| | ඖෂධ පෙරසැරි ගාස්තු ආදායම | 239,968,215 | 305,549,954 |
| | වෛද්‍ය උපකරණ පෙරසැරි ගාස්තු ආදායම | 147,981,580.00 | 162,412,652.00 |
| | විලවුන් පෙරසැරි ගාස්තු ආදායම | 983,000 | 1,791,336 |
| | සිමාස්ථ පෙරසැරි ගාස්තු ආදායම | 11,193,119 | 21,233,147 |
| | සායනික පරීක්ෂණ පෙරසැරි ගාස්තු ආදායම | - | 2,400,342 |
| | ප්‍රචාරණ ගාස්තු ආදායම | 2,164,703 | 1,575,341 |
| | සිල්ලර - ඔසුසල් බලපත්‍ර ආදායම | 26,665,061 | 30,850,341 |
| | තොග - ඔසුසල් බලපත්‍ර ආදායම | 6,108,897 | 9,844,185 |
| | ප්‍රවාහන - ඔසුසල් බලපත්‍ර ආදායම | 19,135,314 | 21,287,366 |
| | ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ගාස්තු ආදායම | 9,643,738 | 3,030,052 |
| | යහපත් නිෂ්පාදන පිළිවෙත් පරීක්ෂා කිරීම - දේශීය | 826,412 | 369,612 |
| | යහපත් නිෂ්පාදන පිළිවෙත් පරීක්ෂා කිරීම - විදේශීය | 89,014,754 | 11,862,707 |
| | WHO යහපත් නිෂ්පාදන පිළිවෙත් සහතිකය | - | 730,930 |
| | COPP සහතික ආදායම | 162,533 | 8,813 |
| | අතිරේක ලියකියවිලි ඉදිරිපත් කිරීම - වෛද්‍ය උපකරණ | 51,670,640 | 130,061,365 |
| | නියෝජිතායතන මාරු කිරීම් ගාස්තු අදායම | 41,196,078 | 32,616,855 |
| | Free sale certificate අදායම | 54,454 | 55,697 |
| | Clarification අදායම | 13,830,962 | 9,732 |
| | A/B කාණ්ඩයේ පෙරසැරි ගාස්තු | 4,202,362 | 3,498,837 |
| | විලවුන් නිෂ්පාදන සහතික අදායම | 217,000 | 171,540 |
| | අතිරේක ලියකියවිලි ඉදිරිපත් කිරීම - ඖෂධ | 83,961,047 | 349,825 |
| | විලවුන් සාම්පල පරීක්ෂා කිරීමේ අදායම | 463,400 | 1,081,321 |
| | සීමාස්ථ නිෂ්පාදන සාම්පල පරීක්ෂා කිරීමේ අදායම | 1,103,156 | 960,605 |
| | වෙනස්කම් සමාලෝචනය සඳහා ගාස්තු අදායම | 3,679,155 | 1,348,486 |
| | වෛද්‍ය උපකරණ ප්‍රතිපාදන ලියාපදිංචි කිරීම් අදායම | - | 1,833,066 |
| | Company frofile - අදායම | 27,740,076 | 1,594,000 |
| | නැවත ඇසුරුම් කිරීම සඳහා අනුමැතිය ලබා දීමේ අදායම | 820,443 | 41,954 |
| | සීමාස්ථ නිෂ්පාදන - ආනයන අදායම | 654,214 | 86,951 |
| | සීමාස්ථ නිෂ්පාදන - ලියාපදිංචි සහතික අදායම | 1,272,716 | 173,901 |
| | NCE සහතික අදායම | 3,361,462 | |
| | | 1,191,761,598 | 1,247,566,713 |
| 15 | වෙනත් ආදායම් | | |
| | ආපසු නොගෙවන ටෙන්ඩර් අදායම | 199,250 | |
| | වෙනත් ආදායම් | 8,320 | |
| | සැපයුම්කරුවන් ලියාපදිංචි අදායම - 2019 | 167,000 | |
| | | 374,570 | |

| | | | |
|---|---|---|---|
| 16 | පරිපාලන වියදම් | | |
| | ක්ෂය | 11,628,106 | 7,873,174 |
| | ජල ගාස්තු | 611,710 | 447,826 |
| | විදුලිය ගාස්තු | 8,633,989 | 8,168,972 |
| | දුරකථන ගාස්තු | 913,710 | 974,894 |
| | තැපැල් ගාස්තු | 368,925 | 371,723 |
| | ලිපි ද්‍රව්‍ය ගාස්තු | 1,995,957 | 1,809,676 |
| | ගමන් වියදම් - දේශීය | 45,641 | 181,975 |
| | ගමන් වියදම් - විදේශ | 33,549,596 | 12,517,630 |
| | පුහුණු හා සංවර්ධන වියදම් | 17,935,115 | 10,563,614 |
| | රසායනාගාර වියදම් | 24,830,467 | 6,608,047 |
| | ඉන්ධන වියදම් | 948,494 | 796,301 |
| | ආරක්ෂක ගාස්තු | 3,524,619 | 3,589,887 |
| | ලේඛන හැසිරවීමේ ගාස්තු | 1,142,262 | 1,035,978 |
| | ප්‍රකාශන, පරිවර්තන සහ ප්‍රචාරණ ගාස්තු | 2,373,271 | 1,665,271 |
| | පිරිසිදු කිරීමේ සේවා ගාස්තු වියදම් | 2,924,475 | 4,442,664 |
| | වාහන නඩත්තු වියදම් | 1,863,140 | 1,677,910 |
| | රසායනාගාර උපකරණ නඩත්තු වියදම් | | - |
| | ගිනි නිවන උපකරණ නඩත්තු වියදම් | 33,201 | 92,237 |
| | වායු සමීකරණ නඩත්තු වියදම් | 6,371,486 | 2,011,251 |
| | ගොඩනැගිල්ල නඩත්තු වියදම් | 6,371,486 | 5,097,276 |
| | පරිගණක අයිතම නඩත්තු කිරීම සහ අනෙකුත් වියදම් | 875,563 | 2,038,916 |
| | යහපත් නිෂ්පාදන පරිචය පරීක්ෂා කිරීම් වියදම් | | 12,500,764 |
| | සම්මන්ත්‍රණ ශාලා වෙන් කිරීම් වියදම් | - | 775,557 |
| | සංයුක්ත සැලැස්ම සකස් කිරීම් වියදම් | | 6,567 |
| | වෙබ් අඩවිය නඩත්තු කිරීම | 559,085 | 411,263 |
| | රෙගුලාසි කෙටුම්පත් කිරීම සඳහා වියදම් | | - |
| | කුරියර් සේවා වියදම් | | 3,402 |
| | වරිපනම් වියදම් | | - |
| | විගණන ගාස්තු | 1,023,000 | 1,281,178 |
| | WHO රැස්වීම් වියදම් | 1,862,297 | 882,440 |
| | වෙන්ඩර් මණ්ඩල වියදම් | | 98,500 |
| | පුහුණු හා සංවර්ධන වියදම් | | 115,800 |
| | විභාග පැවැත්වීමේ වියදම් | | 1,910,022 |
| | විගණන කමිටුවේ වියදම් | | 99,000 |
| | ලිපිගොනු පරීක්ෂණ වියදම් - විශේෂඥ | | 1,219,650 |
| | පොත් සහ ජර්නල මිලදී ගැනීමේ වියදම් | 1,350,237 | - |
| | උපදේශන ගාස්තු | 167,073 | 431,175 |
| | පාරිතෝෂික වියදම් | 893,668 | - |
| | ඡායා පිටපත් යන්ත්‍රය නඩත්තු වියදම් | 88,230 | - |
| | **මුළු පරිපාලන වියදම්** | **132,884,803** | **89,458,597** |

| | | | |
|---|---|---|---|
| 17 | වැටුප් සහ වේතන | | |
| | වැටුප් සහ වේතන | 78,657,424 | 60,564,596 |
| | වෙනත් දීමනා | 5,616,991 | 10,198,127 |
| | අතිකාල දීමනා | 9,537,275 | 8,913,217 |
| | ද්විතීය පදනම් දීමනාව | 2,013,516 | 7,438,689 |
| | විශ්‍රාම වැටුප් සඳහා දායකත්වය | 3,938,179 | 7,438,689 |
| | සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වය | 5,573,051 | 1,879,614 |
| | සේවක භාර අරමුදල සඳහා දායකත්වය | 835,958 | 469,904 |
| | W & OP සඳහා දායකත්වය | 30,308 | |
| | ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා දායකත්වය | 2,875 | |
| | **මුළු වැටුප් හා වේතන වියදම්** | **106,205,576** | **96,902,836** |

| | | | |
|---|---|---|---|
| **18** | **වෙනත් වියදම්** | | |
| | වෙනත් අලුත්වැඩියා සහ නඩත්තු වියදම් | | 731,843 |
| | සංග්‍රහ වියදම් | 884,887 | 47,257 |
| | බැංකු ගාස්තු | 450 | 2,000 |
| | කාර්ය මණ්ඩලය සඳහා තේ ලබාදීමේ වියදම | 2,088,689 | - |
| | නීතිඥ ගාස්තු | 1,601,475 | - |
| | කමිටු සඳහා ගෙවීම් | 1,842,578 | - |
| | වෙනත් වියදම් | 1,423,254 | 570,125 |
| | ලිපිගොනු පරීක්ෂණ වියදම් - විශේෂඥ | 2,888,774 | |
| | e -NMRA වැඩමුළු වියදම් | 4,378,726 | |
| | අධිකාර ගෙවීම | 1,786,817 | |
| | ISO සඳහා ගෙවීම | 165,670 | |
| | **මුළු වෙනත් වියදම්** | **17,061,320** | **1,351,225** |

| | | | | |
|---|---|---|---|---|
| **19** | **වර්ෂය සඳහා අදායම් බදු වියදම්** | | | |
| **19.2** | වර්ෂය සඳහා අදායම් බදු වියදම් | | 306,166,187 | 313,072,390 |
| | වර්ෂය සඳහා විලම්බිත බදු වියදම | | 2,971,330 | 1,101,228 |
| | **වර්ෂය සඳහා බදු වියදම්** | | **309,137,517** | **314,173,618** |
| **19.2** | බදු ගෙවීමට පෙර ශුද්ධ ආදායම | | 1,104,832,308 | 1,123,344,281 |
| | එකතු කරන්න: ඉඩදිය නොහැකි වියදම් | | 12,536,253 | 7,920,431 |
| | අඩු: ඉඩ දිය හැකි වියදම් | | (22,574,992) | (11,806,130) |
| | අඩු : බද්දට යටත් නොවන අදායම් | | (1,342,902) | (1,342,902) |
| | වර්ෂය සඳහා ගලපන ලද ලාභය | | 1,093,450,668 | 1,118,115,679 |
| | බදු වලට යටත් වන වෙනත් ලාභ සහ ආදායම් | | - | - |
| | සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායම/ බදු අය කළ හැකි ආදායම | | 1,093,450,668 | 1,118,115,679 |
| | වර්ෂය සඳහා ආදායම් බදු | 28% දී | 306,166,187 | 313,072,390 |
| | බදු බැර: | | | |
| | Notional tax | | - | - |
| | පෙර වර්ෂය සඳහා නිවැරදි කිරීම | | 226,976 | |
| | වර්ෂය සඳහා අදායම් බදු වියදම | | 306,166,187 | 313,072,390 |
| | **වර්ෂය අවසානයේ ගෙවිය යුතු මුළු බදු** | | **619,465,553** | **426,946,913** |

| | | | |
|---|---|---|---|
| **20** | **පෙර වසර සඳහා ගැලපීම්** | | |
| | පහත සඳහන් කරුණු නිවැරදි කිරීම සඳහා පෙර වර්ෂයේ ගැලපීම් සිදු කරන ලදී. | | |
| | උපචිත එකතු කල අගය මත බදු | | 1,486,792 |
| | උපචිත එකතු කල අගය මත බදු | | 4,909,953 |
| | ආදායම් බදු | | 2,723,519 |
| | අත්තිකාරම් | 2,976,895 | 360,985 |
| | වෙනත් | 14,854,831 | 3,108,322 |
| | මුළු ගැලපුම් මුදල | **17,831,726** | **8,894,017** |

**21 අදාල පාර්ශව හෙළිදරව්**

**ප්‍රධාන කළමනාකරණ වන්දි**

අධිකාරියේ ප්‍රධාන කළමනාකාරීත්වයේ නිලධාරීන්ට සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ අධිකාරියේ අනෙකුත් සාමාජිකයින් ඇතුළත් වේ.
එම කාලසීමාවන් තුළ ප්‍රධාන කළමනාකාරීත්වයේ පුද්ගලයන්ට ගෙවන ලද වන්දි මුදල් පහත පරිදි වේ.

| | 2019<br>රුපියල්. | 2018<br>රුපියල්. |
|---|---|---|
| කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 0 | 0 |
| | - | - |

**22 වාර්තා කළ දිනට පසු සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන ප්‍රමාණාත්මක සිදුවීම් වාර්තා කළ දිනට පසුව සිදු නොවීය.

**23 අනිශ්චිත වගකීම්**

වාර්තා කරන දිනය වන විට කිසිදු බැඳීමක් සහ හදිසි අවස්ථාවක් නොමැත.

**24 නඩු සහ හිමිකම්**

අධිකාරියට එරෙහිව අභියාචනාධිකරණයේ නඩු පහක් ගොනු කර තිබුණි. එම නඩු අතරින් රුපියල් 497,700,000 ක වන්දියක් ඉල්ලා ඇත්තේ HC(සිවිල්) 425/2017MR දරන එක් නඩුවක් සඳහා පමණක් වන අතර තීරණය තවමත් ලැබී නොමැත. තවද, පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීමට එරෙහිව NMRA විසින් නඩු 118ක් ගොනු කරන ලදී. තවද, 2019 දෙසැම්බර් 31 වන දිනට NMRA පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම හේතුවෙන් NMRA හි ආහාර හා ඖෂධ පරීක්ෂකවරුන් විසින් ගොනු කරන ලද එක් නඩුවක් අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

**25 සාමාජික මණ්ඩලයේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සාමාජිකයින්ගේ මණ්ඩලයේ වගකීම වේ.

**21 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම**

මෙම මූල්‍ය ප්‍රකාශන සාමාජිකයින්ගේ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර 2020 සැප්තැම්බර් 23 වැනි දින නිකුත් කිරීමට අවසර දෙන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | එච්එස්එම්/ඒ/එන්එම්ආර්ඒ/1/19/70 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2021 මාර්තු 09 දින |

සභාපති
ජාතික ඖෂධ නියාමන අධිකාරිය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති.

පිටපත - 01. ලේකම්, මුදල් අමාත්‍යාංශය
02. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | එච්එස්එම්/ඊ/එන්එම්ආර්ඒ/1/19/70 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2021 මාර්තු 09 දින |

සභාපති
ජාතික ඖෂධ නියාමන අධිකාරිය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වියාචනය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය වියාචනය සඳහා පදනම

(අ) අධිකාරියේ ගිණුම් තැබීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ආදායම් රු.9,728,822 ක් අඩුවෙන්ද, වියදම් රු.16,766,765 ක් වැඩියෙන්ද දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.26,495,587 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ආ) 2018 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු.2,127,713 ක් ගිණුම්ගත කර නොතිබීමේ වරද නිවැරදි කිරීමේදී පෙර වර්ෂ ගැලපුම් ගිණුමට එම වටිනාකම දෙවරක් හර කර තිබුණි. එම නිසා ඉකුත් වර්ෂයේ ඉදිරියට ගෙනා සමුච්චිත අරමුදල් ශේෂය රු.2,127,713 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்ல, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඈ) ඉකුත් වර්ෂයට අදාළ ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීමේදී එකතුව රු.2,976,895 ක අගයක් ඉදිරියට ලද අත්තිකාරම් ගිණුමට ගැලපිය යුතුව තිබුණද එසේ ගැලපීමකින් තොරව අත්තිකාරම් ගිණුම් තුලනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙවැනි ගිණුම්කරණ දෝෂ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අත්තිකාරම් ගිණුම් ශේෂය හා ඊට අදාළ උපලේඛනය අතර රු.121,182,845 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම විෂයයන් 04 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ ඊට අදාළ උපලේඛන අනුව ශේෂය අතර රු.9,863,462 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර වෙනස්කම් ඇතිවීමට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.

(ඉ) අධිකාරිය පිහිටුවනු ලැබූ 2015 වර්ෂයේ සිටම අමාත්‍යාංශය සතු ගොඩනැගිලි, රථ වාහන, රසායනාගාරය, රසායනාගාර උපකරණ, කාර්යාල උපකරණ හා ලී බඩු සහ සවිකිරීම් ඇතුළු ස්ථාවර වත්කම් රාශියක් අධිකාරිය විසින් පරිහරණය කරන නමුත් එම වත්කම් අධිකාරිය වෙත පවරා ගෙන වත්කම්වල සාධාරණ අගය ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී කෙරීගෙන යන වැඩ (Work in Progress) වෙනුවෙන් ගෙවා තිබුණු රු.5,142,750 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් යෙදවීමක් ලෙස දක්වා නොතිබුණි. එසේම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපුම් අගයක් වශයෙන් දක්වා ඇති රු.900,468,913 ක් සඳහා විස්තරාත්මක උපලේඛන හා පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණු බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබාගැනීමට නොහැකි වූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් ඇති බව නිශ්චය කිරීමට මා හට නොහැකි විය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- මෙම වාර්තාවේ 1.2 (උ) හා (ඌ) ඡේදවල දැක්වෙන නිරීක්ෂණ හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

3

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත | |
| | (i) 43 (2) වන වගන්තිය | ඖෂධ ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබා නොගෙන ඖෂධ නව ලියාපදිංචි කිරීමේ අයදුම්පත් 10 ක් සඳහා තාවකාලික ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. තවද ආයතන 02 ක් වෙත ඖෂධ අයිතම 14 ක් සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීමෙන් පසුව අනුමැතිය සඳහා ඖෂධ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණි. |
| | (ii) 51 වගන්තිය | ඇගයීම ආරම්භකර නොතිබුණු විදේශීය නිෂ්පාදනාගාර 04 කට අදාළ ඖෂධ වර්ග 04 ක් සඳහාද, නිෂ්පාදනාගාර සඳහා අනුමැතිය ලබාදීමට ප්‍රථමයෙන් විදේශීය නිෂ්පාදනාගාර 22 ක ඖෂධ වර්ග 34 ක් සඳහාද ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. තවද, වර්ෂයක් තුළදී යහපත් නිෂ්පාදන පරිචය පිළිබඳ පරීක්ෂාවක් පැවැත්විය යුතුව තිබුණු විදේශීය නිෂ්පාදනාගාරයක් සඳහා වර්ෂ 05 ක් ඉක්මවන තෙක් එම පරීක්ෂාව පවත්වා නොතිබුණු නමුත් එහි නිපදවන ඖෂධ සඳහා අවස්ථා 06 කදී ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. |
| | (iii) 58 , 59 , 82 හා 83 වගන්ති | 2019 වර්ෂයේදී අධිකාරිය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, වෛද්‍ය සැපයීම් අංශය හා අනෙකුත් රජයේ හා පෞද්ගලික ආයතන වෙනුවෙන් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 516 ක් නිකුත් කර තිබුණි. |

4

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | |
|---|---|
| (iv) 59 (4) (ආ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී සාම්පල් ලබා ගැනීමකින් තොරව ඖෂධ නව ලියාපදිංචිය සඳහා ලැබී තිබුණු අයදුම්පත්වලට අදාළව තාවකාලික ලියාපදිංචි සහතික 99 ක් හා වර්ෂ 05 ක් සඳහා නිකුත් කරන සම්පූර්ණ ලියාපදිංචි සහතික 49 ක්ද, ඖෂධ නැවත ලියාපදිංචිය සඳහා ලැබුණු අයදුම්පත්වලට අදාළව ලියාපදිංචි සහතික 29 ක්ද නිකුත් කර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ නව ලියාපදිංචිය සඳහා සාම්පල් 1,168 ක් හා ඖෂධ නැවත ලියාපදිංචිය සඳහා සාම්පල් 440 ක් ලැබී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී පරීක්ෂා කර තිබුණු සාම්පල් ප්‍රමාණය 60 ක් පමණක් වූ අතර ඉතිරි සාම්පල් 1,548 ක් පරීක්ෂා කිරීමට අපොහොසත්ව තිබුණි. |
| (v) 64 වන වගන්තිය | 2020 වර්ෂයේදී ඇගයීම් සිදුකර තිබුණු ආයතන 03 ක ඖෂධ අයිතම 25 ක් ඇගයීම සඳහා වූ ඉල්ලීම් ඖෂධ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් නොකර සම්පූර්ණ ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. |
| (vi) 83 (4) (ආ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී සාම්පල් ලබා ගැනීමකින් තොරව වෛද්‍ය උපකරණ නව ලියාපදිංචිය සඳහා ලැබී තිබුණු අයදුම්පත් 579 ක් සඳහා තාවකාලික ලියාපදිංචි සහතික 246 ක් නිකුත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී රසායනාගාරය විසින් පරීක්ෂා කර තිබුණු සාම්පල් ප්‍රමාණය 01 ක් පමණක් විය. |
| (vii) 109 වන වගන්තිය | පහතේ සඳහන් නොවන හේතුන් මත සමාලෝචිත වර්ෂය තුළදී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 89 ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත නිකුත් කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ අයිතම 03 ක් සඳහා එකම සැපයුම්කරු හෝ නිෂ්පාදකයා වෙත නැවත නැවතත් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කර තිබුණු අවස්ථා 06 ක් විය. |

5

| | | |
|---|---|---|
| | (viii) 119 (1) වගන්තිය | වලංගු බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාර කටයුතු සිදුකරනු ලබන එක් ඔසුසලක් සහ වලංගු කාලසීමාවට අදාළව බලපත්‍රය යාවත්කාලීන කර නොගෙන ව්‍යාපාර කටයුතු සිදුකරන ඔසුසල් 23 ක් පැවති බව 2020 අගෝස්තු 27 වන දින කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි ඔසුසල් 26 ක් පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. එසේම භෞතික පරීක්ෂාව සිදුකරන අවස්ථාවේදී ලියාපදිංචි ඖෂධවේදියෙකු සේවයේ යෙදී නොසිටි ඔසුසල් 12 ක්ද, ඔසුසැල් බලපත්‍රය හා ඖෂධවේදී ලියාපදිංචි සහතිකය ප්‍රදර්ශනය කර නොතිබුණු ඔසුසල් 15 ක්ද, ඖෂධවේදීන්ගේ ඡායාරූප ප්‍රදර්ශනය කර නොතිබුණු ඔසුසල් 05 ක්ද, වායුසමීකරණ යන්ත්‍ර භාවිතයකින් තොරව පවත්වාගෙන යමින් සිටි ඔසුසල් 04 ක්ද වූ අතර ඡායාරූප පිටපත් යන්ත්‍රය ස්ථානගත කර තිබුණු ස්ථානයේම ඖෂධ තබා තිබුණු ඔසුසල් 02 ක්ද විය. |
| (ආ) | 2019 ඔක්තෝබර් 14 දිනැති අංක 2145/1 දරන ගැසට් පත්‍රයේ ඇතුළත් නියෝගයන්හි 1 වන කොටසෙහි 8 වන නියෝගය | ඖෂධයක තාවකාලික ලියාපදිංචිය සඳහා වන කාලසීමාව අවසන්වීමට පෙර සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ අයිතම 07 ක් සඳහාද, 2020 වර්ෂයේදී ඖෂධ අයිතම 25 ක් සඳහාද සම්පූර්ණ ලියාපදිංචිය ප්‍රදානය කර තිබුණි. එසේම තාවකාලික බලපත්‍රයේ වලංගු කාල සීමාව ඉක්මවීමට වර්ෂ 02 කට ආසන්න කාලයක් පැවතියදී ආයතන 03 ක ඖෂධ අයිතම 24 ක් සඳහා සම්පූර්ණ ලියාපදිංචිය පිරිනමා තිබුණි. |
| (ඇ) | 2019 මැයි 15 දිනැති අංක 2123/35 දරන අති විශේෂ ගැසට් පත්‍රය | ඖෂධ 61 ක් සඳහා උපරිම සිල්ලර මිලක් නියම කර තිබුණු නමුත් අධිකාරිය විසින් අවස්ථා 03 කදී නිකුත් කර තිබුණු ඖෂධ 03 ක ලියාපදිංචි සහතිකවල එම උපරිම සිල්ලර මිලට වඩා වැඩි මිලක් නියම කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 10 වන වගන්තිය සහ පනතේ 16 වන වගන්තිය | අධිකාරිය විසින් 2016 ජනවාරි මාසයේ සිට 2018 සැප්තැම්බර් මාසය දක්වාවූ කාලපරිච්ඡේදය සඳහා සේවක අර්ථ සාධක අරමුදල් දායකය නියමිත දිනට ප්‍රේෂණය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.388,261 ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණි. |
| (ඉ) | 2005 අංක 06 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | අධිකාරිය විසින් 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු එකතු කළ අගය මත බදුගෙවීම ප්‍රමාද කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.36,864,100 ක අධිභාරයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පනවා තිබුණි. එසේම 2020 වර්ෂයේ පළමු, දෙවන හා තෙවන කාර්තු තුන සඳහා එකතුකළ අගය මත බදු නිවැරදිව හඳුනාගෙන 2021 ජනවාරි 11 දින වන විටත් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඊ) | 2006 අංක 10 දරන ආදායම් බදු පනතේ 113 වැනි වගන්තිය | අධිකාරියේ ආදායම් බදු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රමාදවී ප්‍රේෂණය කිරීම හේතුවෙන් 2016/2017 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,361,759 ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණි. |
| (උ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 08 ක ප්‍රමාදයකින් පසුව 2020 නොවැම්බර් 11 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. |
| (ඌ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 7.4.1 වගන්තිය | වාර්ෂිකව විගණන කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවද, 2019 වර්ෂය සඳහා එකදු රැස්වීමක්වත් පවත්වා නොතිබුණි. |
| (එ) | 2018 නොවැම්බර් 14 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයට අදාළ මාස 12 තුළ අධිකාරිය සතු ජංගම ගිණුමේ රු.මිලියන 200 ත් රු.මිලියන 900 ත් අතර පැවති අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කර නොතිබුණි. |

7

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  (අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 38 (2) අ වගන්තිය ප්‍රකාරව, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති ජාතික තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය අධිකාරිය වෙත පවරා ගැනීමට හා එහි වත්කම් තක්සේරු කර අධිකාරියේ ගිණුම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

  (ආ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 41 (2), 66 (2) හා 87 (2) වගන්ති ප්‍රකාරව, වෛද්‍ය විද්‍යාව, ඖෂධ වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය හෝ වෙනත් අදාළ විෂයයන් පිළිබඳ උපාධියක් සහිත නිලධාරියෙකු, ඖෂධ නියාමන (Medicine Regulatory) අංශයේ, වෛද්‍ය උපකරණ නියාමන (Medicine Devises Regulatory) අංශයේ හා සීමාස්ථ නිෂ්පාදන නියාමන (Border Line Production Regulatory) අංශයේ ප්‍රධානීන් ලෙස පත්කර නොතිබුණි.

  (ඇ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 61, 84 (2), 85, 103 (2), 104 වගන්ති ප්‍රකාරව, ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ ඖෂධ, ලියාපදිංචි කළ හා ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ගැසට්කර මහජනතාවට දැනුම්දීමට කටයුතු කර නොතිබුණි.

  (ඈ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 123 වගන්තිය ප්‍රකාරව, අධිකාරිය වෙත ඉදිරිපත් කරන අභියාචනා අසා තීරණය කිරීම සඳහා අභියාචනා කමිටුවක් පිහිටුවා නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

  (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුගමනය නොකර හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවන් හා ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී රු.1,724,196 ක් වැය කර වායුසමීකරණ යන්ත්‍ර 06 ක් , කාර්යාලීය උපකරණ අයිතම 13 කට අදාළ ඒකක 41 ක් හා ඇඟිලි සලකුණු යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) අධිකාරිය සඳහා පරිගණකගත පද්ධතියක් (Implementation of Document and Workflow Management System – Automation) ස්ථාපිත කිරීමේ කාර්යය දින 120 ක් තුළ නිම කර 2018 සැප්තැම්බර් 03 දින වන විට අධිකාරිය වෙත භාරදිය යුතුව තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ පරිගණකගත පද්ධතිය ක්‍රියාත්මක කරලීම සඳහා අධිකාරිය වෙත භාරදී නොතිබුණි. එසේ වුවත්, කොන්ත්‍රාත් ගිවිසුම අනුව අයකල යුතුව තිබුණු රු.3,196,518 ක ප්‍රමාද ගාස්තුව අයකිරීමකින් තොරව හා ඒ පිළිබඳව නොසලකා පද්ධතිය ස්ථාපිත කිරීම සම්බන්ධව මෙතෙක් නිම කල වැඩකොටස් වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගමේ ඉල්ලීම පරිදි රු.4,378,726 ක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2019 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 235 ක් වූ අතර ඉන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව 84 ක් විය. 2020 දෙසැම්බර් 31 දින වන විට එම පුරප්පාඩු සේවක සංඛ්‍යාව 101 දක්වා ඉහළ ගොස් තිබුණු අතර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් තනතුරු 07 ක් සඳහා බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කිරීමට හා අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට අපොහොසත් වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී නවක නිලධාරීන් 51 දෙනෙකු අධිකාරිය වෙත බඳවා ගෙන තිබුණු නමුත් 2020 දෙසැම්බර් 31 දින වන විට ඉන් නිලධාරීන් 17 දෙනෙකුම ඉල්ලා අස්වී තිබුණි. අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හා බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය කර නිලධාරීන්ගේ සේවක තෘප්තිය ඇති කිරීම මගින් නිලධාරීන් අධිකාරිය තුළ රඳවා ගැනීම සඳහා කටයුතු කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ආ) ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ සාම්පල් පර්යේෂණ කටයුතු ඖෂධ විශ්ලේෂකයන් 06 දෙනෙකු විසින් පමණක් සිදු කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු රසායනාගාර සහායක නිලධාරියෙකු ඒ සඳහා අනුයුක්ත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම්වල කාර්යසාධන නිර්ණායක නිශ්චිතව, ප්‍රමාණාත්මකව මෙන්ම මැනිය හැකි මට්ටමින් දක්වා නොතිබීම හේතුවෙන් එකී ක්‍රියාකාරකම් ඉටු කර ගැනීමේ ප්‍රගතිය නිශ්චිතව ඇගයීමට නොහැකිවූ අතර ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 11 කට අදාළ කිසිදු කටයුත්තක් සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කිරීමට හෝ අපොහොසත්ව තිබුණි.

(ඈ) ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (National Drugs Quality Assurance Laboratory ) විසින් පර්යේෂණාගාරයේ ප්‍රමිතිය සම්බන්ධයෙන් අනුකූලතා සහතික පිළිබඳ සහතිකය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත 2020 පෙබරවාරි 06 දින අයදුම්පතක් ඉදිරිපත් කර තිබුණු නමුත් විගණිත දිනය වූ 2020 දෙසැම්බර් 31 දින වන විටත් එම ප්‍රමිති සහතිකය ලබාගැනීමට අපොහොසත් වී තිබුණි.

9

(ඉ) ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය සම්බන්ධයෙන් සිදුකර තිබුණු Benchmarking වැඩසටහනට අනුව, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය පිළිබඳව පරීක්ෂා කර තිබුණු නිර්ණායක 07 ක් අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර තිබුණු බවත් නිර්ණායක 02 ක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණු බවත් එම සංවිධානය විසින් නිරීක්ෂණය කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය උපකරණ 861 ක් නව ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර 2020 අගෝස්තු 27 දින වන විට ඉන් වෛද්‍ය උපකරණ 247 ක් සඳහා පමණක් ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. ඉතිරි වෛද්‍ය උපකරණ 614 ක් සඳහා ලියාපදිංචිය ලබාදීමට අපොහොසත් වී තිබුණි.

(උ) ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 119 (4) වගන්තිය තුළ ඔසුසල් ලියාපදිංචියට හා බලපත්‍ර නිකුත් කිරීමට ගතකළ යුතු නිශ්චිත කාලසීමාවක් නිර්ණය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ඔසුසල් 119 ක බලපත්‍ර නිකුත් කිරීම සඳහා මුදල් අයකළ දින සිට බලපත්‍ර නිකුත් කිරීමට මාස 04 සිට වර්ෂ 01 දක්වා වූ විවිධ කාලපරාසයන් ගත කර තිබුණු අතර ඔසුසල් බලපත්‍ර මුද්‍රණය කිරීමෙන් පසු අදාළ බලධාරියාගේ අත්සනින් යුතුව බලපත්‍රය නිකුත් කිරීම සඳහා මාස 01 සිට මාස 10 දක්වා වන කාලයක් ගතකර තිබුණු අවස්ථා 117 විය. බලපත්‍ර මුද්‍රණය කළ දින සිට නිකුත් කිරීම දක්වා මෙතරම් කාලයක් ගතකර තිබීමට පිළිගත හැකි හේතු ඉදිරිපත් නොකෙරුණි.

(ඌ) 2019 සැප්තැම්බර් 01 දින සිට මාර්ගගත පරිගණක ස්වයංක්‍රීයකරණ පද්ධතිය (Online Automation System) මගින් පියවර 03ක් යටතේ ඔසුසල් බලපත්‍ර (සිල්ලර හා තොග) නිකුත් කිරීම සඳහා අධිකාරිය විසින් කටයුතු කර තිබුණි. නමුත් ඔසුසල් හිමියන්ට මෙම ක්‍රමය පිළිබඳ අවබෝධයක් නොමැති වීම, තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවීම, කාර්යක්ෂම පරිගණක අයිතම නොමැති වීම හා අන්තර්ජාල පහසුකම් පිළිබඳ ගැටළු ආදී වූ කරුණු හේතුවෙන් මෙම පද්ධතිය User Friendly නොවීම සම්බන්ධයෙන් ඔසුසල් හිමියන් විසින් අදහස් ප්‍රකාශකළ අතර ඒ හේතුවෙන් ඔසුසල් බලපත්‍ර ලබා ගැනීමේ උනන්දුව තවදුරටත් හීනවී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 31 දින වන විට අධිකාරිය වෙත ලද ඔසුසල් බලපත්‍ර ආදායම රු.30,842,902 කින් පහළ ගොස් තිබුණු අතර මෙයට මාර්ගගත පරිගණක ස්වයංක්‍රීයකරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය යථාවත් නොවීමද බලපා තිබුණි.

(එ) ඔසුසල් බලපත්‍ර ලබා ගැනීම සඳහා මුදල් ගෙවා තිබුණු නමුත් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදය සඳහා හා බලපත්‍ර ලබා ගැනීමකින් හෝ බලපත්‍ර අලුත් කර ගැනීමකින් තොරව ව්‍යාපාර කටයුතු සිදුකිරීම වැළැක්වීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අධිකාරිය විසින් ස්ථාපිත කර නොතිබුණු අතර සමස්ථ දිවයින පුරා සිදු කළ යුතු ඖෂධ වෙළෙඳසැල් පිළිබඳ අධීක්ෂණ කටයුතු ප්‍රමාණවත් පරිදි සිදු කර නොතිබුණි.

10

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඒ) නිෂ්පාදනාගාර ලියාපදිංචිය සඳහා වූ අයදුම්පත් අඩංගු ලිපිගොනු 6 ක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ ලියාපදිංචිය සඳහා ලැබී තිබුණු අයදුම්පත් සංඛ්‍යාව 2,097 ක්වූ නමුත් නිකුත් කළ ලියාපදිංචි සහතික සංඛ්‍යාව පිළිබඳ තොරතුරුද, නැවත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වූ වෛද්‍ය උපකරණ 250 ක් වෙනුවෙන් නිකුත් කළ ලියාපදිංචි සහතික පිළිබඳ තොරතුරුද විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. ඊට අමතරව සමාලෝචිත වර්ෂයේදී රු.43,171,293 ක ගනුදෙනු සම්බන්ධයෙන් අධිකාරිය වෙත නිකුත් කළ විගණන විමසුම් 12 ක් සඳහා පිළිතුරුද, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය සම්බන්ධයෙන් සිදුකර තිබුණු Benchmarking වැඩසටහන සම්බන්ධයෙන් එම සංවිධානය විසින් නිකුත් කර තිබුණු වාර්තාවේ සඳහන් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ රසායනාගාර පරීක්ෂණ (Laboratory Testing) සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර තිබුණු නිර්දේශයන් 37 හි වර්තමාන ප්‍රගතියද විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති.

11

# 04 වන පරිච්ඡේදය

## කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීම තිරසාර සංවර්ධන ඉලක්ක (SDG)

ජාත්‍යන්තර සංවර්ධනය ලොව පුරා ජීවත් වන මිනිසුන්ගේ අවශ්‍යතා සහ ලැදිකම් තුළින් ඔවුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීමට උත්සාහ කරයි. සෞඛ්‍යය, අධ්‍යාපනය, ප්‍රජාතන්ත්‍රවාදය, තිරසර බව සහ ආර්ථිකය වැනි ක්ෂේත්‍ර සමඟ වැඩි අවස්ථා සහිතව වඩාත් සාධාරණ ජීවිත ගත කිරීමට මිනිසුන් වඩාත් හොඳින් සූදානම්ව සිටිති. එක්සත් ජාතීන් සිය සංවර්ධන වැඩසටහන (UNDP) තුළින් "2030 වර්ෂය වන විට දුප්පත්කම අවසන් කිරීම, පෘථිවිය ආරක්ෂා කර ගැනීම සහ සියලුම මිනිසුන් සාමයෙන් සහ සමෘද්ධිමත්ව සතුටින් ජීවත්වීම" සහතික කිරීම පිණිස තිරසර සංවර්ධන අරමුණු (SDG) සමඟ වැඩ කරමින් කටයුතු කරයි. රටවල් සහ පාලන ප්‍රදේශ 170 කටත් අධික ගණනක දිළිඳු බව, ඒඩ්ස් (AIDS) කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව වෙනස්කම් කිරීම යන ප්‍රශ්න පිළිබඳව විසඳුම් ලබා දීමට අවශ්‍ය කටයුතු කරමින් සිටී.

ඉලක්ක 17 න් 3 වෙනි ඉලක්කය වන්නේ මිනිසුන්ට සෞඛ්‍ය සම්පන්නව ජීවත්වීමට ඔවුන්ගේ "ශීමනා සෞඛ්‍යය හා සුභසාධනය" සැලසීමට වගබලා ගැනීම ය. එමගින් ළමා මරණ නැති කොට මිනිසුන්ගේ අපේක්ෂා ඉහළ නැංවිය හැකි අතර එය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) විෂයපථයට ඉතාමත් සමීප ලෙස අදාල වේ.

ඒ අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සියලුම ක්‍රියාකාරකම් සකස් කරනු ලබන්නේ උපදෙස් දී ඇති පරිදි අංක 3 දරණ මෙම තිරසර සංවර්ධන අරමුණෙහි (SDG) ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා ය.

3.8 සියලුම දෙනාට මූල්‍ය අවදානම් ආරක්ෂාව, ගුණාත්මක බවින් යුත් අත්‍යාවශ්‍ය සෞඛ්‍යාරක්ෂක සේවාවන්ට ප්‍රවේශවීමේ හැකියාව සහ සුරක්ෂිත, ඵලදායි, තත්ත්වයෙන් ඉහළ සහ දැරිය හැකි මිලක් සහිත අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත් ලබා ගැනීමට ප්‍රවේශවීමේ හැකියාව ඇතුළුව විශ්ව සෞඛ්‍ය ආවරණයක් සාක්ෂාත් කර ගැනීම.

3.අ දුම්කොළ පාලනය සම්බන්ධ ලෝක සෞඛ්‍ය සංවිධාන සම්මේලනයේ වැඩරාමුව සියලුම රටවල යෝග්‍ය පරිදි ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම.

3.ආ සංවර්ධනය වෙමින් පවතින රටවලට මූලිකවම බලපාන බෝවන සහ බෝනොවන රෝග සඳහා එන්නත් සහ ඖෂධ සම්බන්ධයෙන් සිදුකරනු ලබන පර්යේෂණ සහ වැඩිදියුණු කිරීම්වලට සහායවීම, මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ සුනම්‍යතා සම්බන්ධ බුද්ධිමය දේපළ අයිතීන්වල වෙළඳ සම්බන්ධ අංග සහිත ගිවිසුමේ (Agreement on Trade Related Aspects of Intelleatual Property Rights) දැක්වෙන ප්‍රතිපාදන සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාවට සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමේ අයිතිය සහතික කරනු ලබන TRIPS ගිවිසුම හා මහජන සෞඛ්‍යය සම්බන්ධ දෝහා ප්‍රකාශනයට අනුකූලව දැරිය හැකි මිලකට ලබාගත හැකි අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත්වලට ප්‍රවේශය ලබාදීම සහ සියලුම දෙනා සඳහා ඖෂධවලට ප්‍රවේශය ලබාදීම.

3.ඇ සෞඛ්‍ය කටයුතු සඳහා මූල්‍ය දායකත්වය විභව ලෙස වැඩි කිරීම හා සංවර්ධනය වෙමින් පවතින රටවල විශේෂයෙන්ම අඩුවෙන්ම සංවර්ධනය වී ඇති රටවල සහ සංවර්ධනය වෙමින් පවතින තත්ත්වයේ සිටින කුඩා දූපත්වල සෞඛ්‍ය ශ්‍රමබලකාය බඳවා ගැනීම්, ඔවුන් සංවර්ධනය කිරීම, පුහුණු කිරීම, සහ රඳවා ගැනීම.

මෙම සියලුම ඉලක්ක ඖෂධ හා වෛද්‍ය උපකරණවල සුරක්ෂිත බව, ගුණාත්මක බව, සඵලත්වය හා මිල සම්බන්ධ කරුණු පෙරදැරි කරගෙන ඒවා නියාමනය කරමින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) විෂයපථය තුළින් ඉටු කරනු ලබයි.

# 5 වනපරිච්ඡේදය

# මානව සම්පත් පැතිකඩ

## 5.1 පිරිස් කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 12 | 22 |
| තෘතීයික මට්ටම | 6 | 1 | 5 |
| ද්විතියික මට්ටම | 155 | 92 | 63 |
| ප්‍රාථමික මට්ටම | 50 | 36 | 14 |
| සමස්ත | **245** | **141** | **104** |